**මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය - 2021**

---------------------------------------------

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ඔක්තෝබර් 04 දින එළඹි අංක 6006 දරන මූල්‍යකරණ ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණය මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

මූල්‍යකරණ ගිවිසුමට අනුව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයින් අතර මූල්‍ය වෙළඳපොල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ මූල්‍ය සේවා භාවිතය ඉහළ නැංවීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍යකරණය, ආයෝජන පදනම් වූ මූල්‍යකරණය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඉදිරිපෙළ ශාස්තුව යන සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍යකරණ ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,125 කට සමාන එජඩො මිලියන 75 ක් වන අතර මුළු මුදලම මූල්‍යකරණය කිරීමට අන්තර්ජාතික සංවර්ධන සංගමය (IDA) එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 18 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එහි කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

------

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්පත් කරගත් කාර්යසාධනය | | |
| | ඒකක | ඒකක | | |
| සංරචකය - 01 | 13 උපයෝජනය සබැඳි ප්‍රතිඵල (DLR) | 04 උපයෝජනය සබැඳි ප්‍රතිඵල (DLR) | මෙම සංරචකය යටතේ ක්‍රියාකාරකම් 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. 2021 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබූ ක්‍රියාකාරකම් අතරින් 2021 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරකම් තුනක් (03) අවසන් වී නොමැති අතර, ක්‍රියාකාරකම් හයක් (06) ආරම්භ කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය |
| සංරචකය - 02 | නියාමන ආයතන තුනක සංවිධාන ධාරිතාව ශක්තිමත් කිරීම | - | මෙම සංරචකය යටතේ ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති 06 ක් අවලංගු කර හා ව්‍යාපාති 02 ක් ආරම්භ කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය |
| කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිරීක්ෂණයට එකඟ වන අතර, 2021 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ නොකළ හෝ ආරම්භ නොකළ ලෙස ලැයිස්තුගත කර ඇති 01 සහ 02 යන සංරචක දෙකෙහිම බොහෝ ක්‍රියාකාරකම් 2022 පෙබරවාරි 17 දින ණය අවලංගු කිරීමේ ලිපියට ඇතුළත් කර ඇත. | | | |
| විගණකගේ නිර්දේශය | අපේක්ෂිත සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | | | |

### 2.2 භාවිත නොකළ සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 75 කට සමාන වන රු.මිලියන 13,125 ක් වේ. ව්‍යාපෘතිය ආරම්භ කර වසර තුනක් ඉකුත් වී තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විට මුළු ණය උපයෝජනය රු.මිලියන 1,371.44 ක් හෙවත් එජඩො මිලියන 7.23 ක් වන අතර, එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 9.6 ක් පමණි. | ප්‍රධාන වශයෙන් බොහෝ ප්‍රසම්පාදන කටයුතු ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමයට අනුව සිදු වූ අතර, පසුගිය වසර දෙක තුළ රට තුළ ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතුවලට දැඩි බලපෑමක් එල්ල විය. | වෙන් කර ඇති මුළු මුදල් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ රජයේ ණය ගිණුම්කරණ පද්ධතියට අනුව, උපයෝජනය නොකරන ලද ණය සඳහා එජඩො 179,698 ට සමාන රු.මිලියන 35.6 ක්, ණය දෙන නියෝජිතායතනය වෙත බැඳීම් ගාස්තු (Commitment Charges) ලෙස ගෙවා තිබුණි. | - එම - | නියමිත පරිදි අරමුදල් භාවිත කරමින් අනවශ්‍ය බැඳීම් ගාස්තු ගෙවීම අවම කිරීමට කටයුතු කළ යුතුය. |